ඒරාවූර් පත්තු ප්‍රාදේශීය සභාව
මඩකලපුව දිස්ත්‍රික්කය
--------------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 09 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 02 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 07 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ඒරාවූර් පත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවීම
-----------------------------------------------------------------

පළාත් පාලන පළාත් සභා අමාත්‍යංශ ලේකම්ගේ 2014 ජනවාරි 27 දින පීඑල්/5/පීඒ/එස්එෆ්පීඑස්ඒඑස් අංක දරණ චක්‍රලේඛය ප්‍රහාරව රාජ්‍ය අංක ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවියයුතු විගණන ගාස්තුව වන රු. 22,000 ක් සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) 2011 වර්ෂය සිට උසාවි දඩ මුදල් වශයෙන් ලැබුණු රු. 2,235,083 ක් ආදායම් ගිණුමේ ගිණුම් ගත නොකර තැන්පත් ගිණුමේ තැන්පත්කර තිබුණි.

(ඇ) සභා අරමුදල් මගින් කරන වැඩසටහන් යටතේ වෙන්කලඩි මහජන පුස්ථකාලයේ කියවීම ශාලාව ඉදිකිරීම සඳහා රු. 1,559,033 ක් වෙන්කර තිබුණි. එම මුදල් යොදවා කිසිම වැඩක් කර නොතිබුනද මෙම මුදල් මූල්‍ය ප්‍රකාශනයේ වත්කම් සහ ණය හිමි වශයෙන් පෙන්වා තිබුණි.

(ඈ) ප්‍රාදේශීය සභාවට අයත් වාහන 15 ක් සහ ව්‍යාපෘති ආයතනවලින් පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ කාර්යාල උපකරණ වර්ග 17 ක වටිනාකම තක්සේරුකර ගිණුම්වලට ගෙනවිත් නොතිබුණි.

1.3.3 ලැබියයුතු සහ ගෙවියයුතු ගිණුම්

-------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ස්ථාන මාරුවී ඇති සහ සේවය හැරගිය සේවකයන් 15 දෙනෙකු වෙත ප්‍රාදේශීය සභාවෙන් ලබා දී තිබූ ණය මුදල් වලින් හිඟ ශේෂයවන රු. 962,312 ක් වර්ෂ 2 සිට වර්ෂ 13 වඩා වැඩි කාලයක් අයනොවී තිබුණි. මේ සම්බන්ධයෙන් සභාව අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවට අයත් පොළෙහි පිහිටි කඩ කාමර බදු දීමට අදාලව 2009 සිට 2013 වර්ෂය දක්වා හිඟ බදු කුලිය වන රු. 2,555,066 ක මුදල අදාල පුද්ගලයින්ගෙන් අයකර ගැනීමට හෝ ඔවුන්ට එරෙහිව නීතියානුකූලව කටයුතු කිරීමට සමාලෝචන වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) 1995 සිට 2009 දක්වාවූ කාල පරිච්ඡේදයතුල විවිධ පාර්ෂවයින් වෙත රු. 1,882,337 ක් හෙවා නිරවුල් කිරීමට කටයුතු නොකර දිගටම මූල්‍ය ප්‍රකාශවල ණය හිමියන් වශයෙන් පෙන්වා තිබුණි.

1.3.4 නීති, රීති හා රෙගුලාසි සනාදියට අනුකූල නොවීම

----------------------------------------------------------

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂනය විය.

| නීති, රීති යනාදියට යොමුව<br>----------------------------- | අනුකූල නොවීම<br>------------------- |
|---|---|
| (අ) 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ වගන්ති 134(1) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තිබෙන ජංගම නොවන වතකම් හඳුනාගෙන එහි වාරිෂික වටිනාකම තක්සේරුකර වරිපමනම්බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1988 වර්ෂයේ ප්‍රාදේශිය සභා (මුල්‍ය හා පරිපාලන ) රීති<br>------------------------------------------ | |
| (i) පරිච්ඡේදය 1 වගන්තිය 5 (XII) | මුදල්, ගබඩා ද්‍රව්‍ය සහ චෙක්පත්වලට අත්සන් තැබීම යනාදී කටයුතු නිලධාරින් හතර දෙනෙකුට පරිපාලනමය වශයෙන් භාරදී තිබුනද ඔවුන්ගෙන් ආරක්ෂක ඇප ලබා ගෙන නොතිබුණි. |
| (ii) පරිච්ඡේදය III වගන්තිය 81 | ඉඩම් වල අයිතිය පැවරීම සම්බන්ධව මුද්දර බදු ප්‍රතිපූර්ණ කිරීමේ අයදුම්පත් රෙජිස්ටාර් ජනරාල් වෙතද අනෙකුත් ගනුදෙනු සම්බන්ධ බදු ප්‍රතිපූර්ණය කිරීම සඳහාවූ අයදුම්පත් මහාභාණ්ඩාගාරයේ අධ්‍යක්ෂකවරයාටද දඩමුදල් ප්‍රතිපූර්ණ කිරීම සඳහාවූ අයදුම්පත් උසාවිවල ලේඛකාධිකාරි වෙතද එක් එක් කාර්තු අවසානයෙදීද ඉදිරිපත් කර නොතිබුණි. |

(iii) පරිච්ඡේදය X වගන්තිය 193 — වර්ෂයේ තත්‍ය ආදායම් සහ වියදම් සම්බන්ධයෙන් විස්තර අයවැය ලේඛනය සමහ සංසන්දනය කර විචලනයක සඳහා හේතු දක්වන විස්තර ප්‍රකාශයක් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තික වියදම් ඉක්මවූ ආදායම් රු. 16,949,222 ක් වූ අතර, එය සැසඳීමේදී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 14,212,706 ක්වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු. 2,736,516 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණ.

2.2 ආදායම් පරිපාලනය
------------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හිඟ ආදායම්
----------------------------------------------------------

(අ) සභාව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම් | තත්‍ය ආදායම් | සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| බදු කුලී | 4,085 | 5,625 | 4,634 |
| බලපත්‍ර ගාස්තු | 1,096 | 1,254 | 104 |

(ආ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටා තිබූ සිනමා ශාලාවකින් 2014 පෙබරවාරි සිට 2014 දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදයට අයත් විනෝද බදු රු. 359,381 ක මුදල අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඇ) 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 156 වන වගන්තිය අනුව ගැසට් දැන්වීම් මගින් ගාස්තු විස්තර දැනුම්දී සභා බල ප්‍රදේශයේ පිහිටුවා තිබෙන පුද්ගලික සංනිවේදන කුළුනු 12 ක් සහ දැන්වීම් පුවරු සම්බන්ධයෙන් බදු කිසිවක් අයකර නොතිබුණි. මේ හේතුවෙන් සභාවට වාර්ෂිකව රු. 50,000 ක ආදායමක් අහිමිවී තිබුණි.

2.2.2 වරිපනම් බදු සහ බදු
-----------------------

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134, 158 සහ 159 වගන්තිවලට අනුව ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පිහිටි ඉඩම්, ඉදිකරන ලද නිවාස, ගොඩනැගිලි යනාදිය සඳහා වරිපනම් බදු අයකිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව ලවා වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමට කටයුතු නොකිරීම නිසා

සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් ඇස්තමේන්තු කරන ලද රු. 1,000,000 ක ආදායමක් අයකිරීමට නොහැකිව තිබුණි.

2.2.3 මුද්දර ගාස්තු

--------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම් ගෙන් 2013 සහ 2014 වර්ෂයන් සඳහා ලැබියයුතු මුද්දර ගාස්තු රු. 20,947,922 ක මුදල ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බහු මාධ්‍ය අධ්‍යාපන ඉංග්‍රීසි වැඩ සටගන (Multi Media Educational Programme) පැවත්වීම සඳහා ප්‍රමාණ පාදක ප්‍රාග්ධන ආධාර (CBG) රු. 200,000 මුදලක්ද සභා අරමුදලින් රු. 30,000 වශයෙන් එකතුව රු. 230,000 ක් වැයකර 2012 වර්ෂයේදී සීඩී තැටි මිලදීගෙන තිබුණු අතර එම වර්ෂයේ මෙම වැඩ සටහන ආරම්භකර තිබුනද 2013 වර්ෂයේදී එම වැඩ සටහන අත්හැර දමා තිබූ බැවින් මිලදීගත් සීඩී තැටි නිෂ්කාර්යව තිබුණි.

(ආ) දීර්ඝ කාලයක සිට හිඟව තිබූ සමස්ත එකතුව රු. 1,814,521 ක බදු සහ බදු මුදල අයකර ගැනීම සඳහා 12 දෙනෙකුට එරෙහිව නඩු පැවරීම සඳහා නැගෙනහිර පළාත් සභාවේ නීති අංශයෙන් උපදෙස් ලබා නොගෙන පුද්ගලික නීතිඥ වරයෙකුට 2013 වසරේ රු. 41,802 ක් වැයකර තිබුණද හිඟ මුදල මෙතෙක් අයකරගෙන නොතිබුණි.

3.2 කළමණාකරණ දුර්වලතා

----------------------------

ගංවතුර බැස යාමට අවශ්‍ය කටයුතු කරීම සඳහා JCB යන්ත්‍රයක කුලියට ලබා ගැනිම සඳහා අත්තිකාරම් වශයෙන් රු. 300,000 එක් පුද්ගලයෙකුට 2012 දෙසැම්බර් 28 දින ගෙවා තිබුණි. කෙසේවුවද, වැඩ නිමකළ බවට සහ ලබා දුන් අත්තිකාරම් පියවූ බවටද සාක්ෂි කිසිවත් ඉදිරිපත් නොතිබුණි.

4 ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

---------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

-----------------------

එක් එක් පළාත් පාලන ආයතන තමන්ගේ හැකියාව අනුව අභ්‍යන්තර විගණන අංශයක් පිහිටා ගත යුතු බව පළාත් සභා පළාත් පාලන අමාත්‍යාංශයේ 2005 නොවැම්බර් 08 දින අංක 03 දරණ පළාත් පාලන ආයතන ප්‍රතිසංස්කරන චක්‍රලේඛ අංක 08 හි සඳහන් පරිදි අභ්‍යන්තර විගණන අංශය පිහිටුවා නොතිබුණි.

4.2 අයවැය පාලනය

-------------------

අයවැයගත වියදම් සහ තත්‍ය ආදායම් අතර 28% සිට 100% දක්වා විචලනයක් නිරීක්ණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

4.3 නොවිසඳු සහ පිළිතුරු නොලද විගණන විමසුම්
-----------------------------------------------------
සමාලෝචිත වර්ෂයේදී යවන ලද විගණන විමසුම් දෙකකට 2015 මැයි 30 දක්වා පිළිතුරු එවා නොතිබුණි.

5 පද්ධති හා පාලන
--------------------
පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) ස්ථාවර වත්කම් පාලනය
(ඈ) අයවැය පාලනය